# WEATHER FORECAST FOR 29th JANUARY 2018

## (Issued at 05.30 a.m. on 29th January 2018)

**A change in the prevailing dry weather is expected in the Eastern, North-central and Uva provinces from today.**
Showers or thundershower will occur at times in Eastern, Northern, North-Central and Uva provinces and in Hambantota district.
Showers or thundershower may occur most places elsewhere after 2.00pm.
Fairly heavy falls (about 75mm) can be expected at some places particularly in Eastern province.
Fairly strong gusty winds (up to 40 kmph) can be expected in the Northern, Western, North-western and Uva provinces and in the Hambantota district.
Misty conditions can be expected at some places in the island during the morning.

**නැගෙනහිර, උතුරු මැද සහ ඌව පළාත්වල පවතින වියළි කාලගුණ තත්ත්වයේ වෙනසක් අද දින සිට අපේක්ෂා කල හැක.**
නැගෙනහිර, උතුරු, උතුරු මැද සහ ඌව පළාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයේත් විටින්විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.
සෙසු බොහෝ ප්‍රදේශවල සවස 2.00 න් පසු වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.
නැගෙනහිර පළාතේ සමහර ස්ථානවලට මි.මී. 75 පමණ තරමක් තද වැසි ඇති විය හැක
උතුර,බස්නාහිර, වයඹ සහ ඌව පළාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයේත් විටින් විට හමන (පැ.කි.මී 40 දක්වා) තරමක් තද සුළං බලාපොරොත්තු විය හැක.
දිවයිනේ සමහර ප්‍රදේශවල උදය කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් බලාපොරොත්තු විය හැක.

# WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 29th January 2018)

Due to the low level atmospheric disturbance in the south-eastern deep sea areas, heavy showers or thundershowers may occur at times in the eastern and south-eastern deep and shallow sea areas.
Mainly fair weather will prevail in other sea areas.
Winds will be northerly or north-easterly in direction in the sea areas around the island and wind speed will be 30-40 kmph.
The deep and shallow sea areas around the Island except the sea area off the coast extending from Ambalangoda to Hambantota via Galle, will be rough at times as wind speed increase up to 60-70 kmph at times.
Temporarily very strong gusty winds (up to 70-80 kmph) and very rough seas can be expected during thundershowers.
(Naval and fishing communities are requested to be vigilant in this regards)

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය
## 2018 ජනවාරි මස 29 වන දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

දිවයිනට ගිනිකොණ දෙසින් පහළ වායුගෝලයේ පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන්, දිවයිනට නැගෙනහිර සහ ගිනිකොණ දෙසින් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල විටින් විට තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.
අනෙකුත් මුහුදු ප්‍රදේශවල ප්‍රධාන වශයෙන් වැසි රහිත කාලගුණ තත්ත්වයක් පවතී.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං උතුරු දිශාවෙන් හෝ ඊසාන දිශාවෙන් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. 30-40ක් පමණ වේ. අම්බලන්ගොඩ සිට ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශය හැර සෙසු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. 60-70 දක්වා වැඩි විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව ඉතා තද සුළං (පැ.කි.මී. 70-80 දක්වා) ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.
(ධීවර සහ නාවික ප්‍රජාවගෙන් මේ සම්බන්ධයෙන් විමසිලිමත් වන මෙන් ඉල්ලා සිටී)

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 29/01/2018
Time : 0550
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE